# රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමත් සමඟ සිංහල භාෂාවේ ඇති වූ වෙනස්කම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය. (යටත් විජිත සමය ඇසුරින්)

*ටී.ඩී. තරුෂි නෙත්මි [1]*

සිංහල භාෂාවේ ආරම්භයේ පටන් විසි එක්වන සියවස දක්වා සිංහල භාෂාවේ ප්‍රවර්ධනය පිළිබඳ සලකා බලන විට විවිධ කාල පරාස තුළ ලංකාවේ සිදු වූ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වෙනස්කම් මේ සඳහා බලපෑම් කර ඇත. මෙම හේතු අතරින් යටත් විජිත යුගයේ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමට සමගාමීව සිංහල භාෂා වාක්කෝෂයේ ඇති වූ වෙනස පිළිබඳ අධ්‍යයනය පර්යේෂණ අරමුණ බවට පත්විය. සිංහල භාෂාවේ වටිනාකම පිළිබඳ වැඩි වශයෙන් කතාබහට ලක්වන සමයක සිංහල භාෂාවේ වාක්කෝෂය පෘථුල වීමට රෝමානු කතෝලික ආගම ඇසුරින් දායකත්වයක් ලැබී ඇත්ද යන්න සෙවීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. රෝමානු කතෝලික ආගම ව්‍යාප්තවීම සමග සිංහල භාෂාව තුළ ඇති වූ වෙනස්කම් කෙබඳු ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සාහිත්‍ය හා ලේඛන විශ්ලේෂණ ක්‍රමය භාවිත කළ අතර ද්විතීය මූලාශ්‍රය ලෙස සිංහල භාෂාවේ සම්භවය හා යටත්විජිත යුගයේ රෝමානු කතෝලික ආගම පිළිබඳ ග්‍රන්ථද තෘතීය මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලයද යොදාගනු ලැබීය. මෙසේ ගොනු කරගත් දත්ත අනුව රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීම හේතුවෙන් සිංහල භාෂා වාක්කෝෂය වර්ධනය වී ඇති බව අනාවරණය විය. අතීත ශ්‍රී ලංකාව තුළ ඇතිවූ විදේශීය ආක්‍රමණ හරහා ද සිංහල භාෂාවේ වාක්කෝෂය පෘථුල විය. මේ අතර සුවිශේෂී සිදුවීමක් ලෙස රෝමානු කතෝලික දහම ව්‍යාප්ත වීම හා ඒ සමඟ සිංහල වාක්කෝෂයට නවාංග එක්වීම හඳුන්වාදීමට හැකිය. භාෂාවකට නවාංග එක්වීම තුළින් පැහැදිලි වන ප්‍රධානතම කරුණක් නම් එම සමාජයට මේ සිදුවීම සුවිශාල ලෙස බලපෑම් කරඇති බවයි. මෙසේ භාෂාවේ වර්ධනයට එක් වූ වචන බොහෝමයක් කතෝලික පල්ලිය හා ඒ වටා බැඳුනු සංස්කෘතිය මූලික කරගත් ඒවාය. මේ ආකාරයට ලාංකිකයන්ට නුහුරු සංස්කෘතියක් ලංකාව තුළ ස්ථාපිත වනවිට ඒ පිළිබඳ සන්නිවේදනයට භාෂාව ප්‍රමාණවත් නොවීම නිසා මේ ආකාරයට භාෂාවට නවාංග එක් වීම හා ඒ ඇසුරින් සිංහල භාෂාව වර්ධනය වී ඇතැයි නිගමනය කළ හැකිය. මේ අනුව බැලූවිට සිංහල භාෂා වාක්කෝෂය පෘථුල වීමට කතෝලික ආගම ලංකාව තුළ ව්‍යාප්ත වීමද හේතු වී ඇති බවට නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** පූජකවරු, යටත් විජිත යුගය, රෝමානු කතෝලික ආගම, වාක්කෝෂය, සිංහල භාෂාව

[1] භාෂා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ssh2020305@ssh.rjt.ac.lk